## 151 ධීවර අමාත්‍යාංශය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

151 - ධීවර අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 20 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 12 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.6 | විගණනයට අවශ්‍ය විස්තර ඉදිරිපත් නොකිරීම | 1.6.4(අ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.743,452 ක් විය. එම හිඟ හිටි ණය ශේෂවලින් රු.629,842 ක් හෙවත් සියයට 84 ක් වර්ෂ 20 ට වැඩි කාලයක සිට අය නොවී පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී ද එම ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | 2023.01.01 දිනට රු. 1,095,937 ක්වූ හිඟ හිටි ණය ශේෂය රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි උපදෙස් අනුව කටයුතු කිරීම හේතුවෙන් 2023.12.31 දිනට රු. 743,452 දක්වා අඩු වී ඇත. එම ණය ශේෂයෙන් රු. 629,842 ක මුදල වසර 20ක කාල පරාසයක සිට හිඟ හිට ඇත. කෙසේ වුවද රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි උපදෙස් අනුගමනය කරමින් එම ණය ශේෂයද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟහිටි ණය ශේෂ අයකර ගත යුතුය. |

**(ආ) තැන්පතු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව එක් එක් මාසයේ දායක මුදල්, ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවීමට කටයුතු කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වුවද, 2022 නොවැම්බර් මස සිට 2023 අප්‍රේල් මස දක්වා වූ ධීවර රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයෙන් අය කරගෙන තිබූ රු.545,256 ක්වූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය හා 2023 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා වූ ධීවර රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයෙන් අය කරගෙන තිබූ රු.816,123 ක්වූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය ව්‍යාවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි නොතිබීම හේතුවෙන් 6000-0-0-18-0-151 දරන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් තාවකාලික රඳවා ගැනීම් තැන්පතු ගිණුමේ රු.545,256ක මුදලක් සහ 6000-0-0-18-0-45 151 දරන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් තාවකාලික රඳවා ගැනීම් තැන්පතු ගිණුමේ රු.816,123ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇත. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වන ලෙස එම නිලධාරීන් දැනුවත් කර ඇත. | 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, වර්ෂ 2-5 ත් අතර වූ එකතුව රු.167,195,801 ක තැන්පතු ශේෂ ද, වර්ෂ 5 ඉක්මවූ රු.31,910,669 ක්වූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | වර්ෂ 2 ඉක්මවූ පොදු තැන්පත් ගිණුමේ පවතින ශේෂයන් තවදුරටත් තබාගැනීමට හේතූන් එම ගිණුම සමඟ ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | දළ රළ සවිය 2023 ලෝක ධීවර දිනය වෙනුවෙන් විවිධ පෞද්ගලික ආයතන විසින් ධීවර අමාත්‍යාංශය වෙත රු.2,920,000 ක මූල්‍යාධාර ලබා දී තිබුණු අතර එයින් රු.2,313,791 ක් සමාලෝචිත වර්ෂය තුල වියදම් කර ඉතිරි රු.606,209 ක මුදල අංක 6000-0-0-13-0-40 දරන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලික රඳවා ගන්නා තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණ අතර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | දළ රළ සවිය 2023 ලෝක ධීවර දිනය වෙනුවෙන් විවිධ ආයතන වෙතින් ධීවර අමාත්‍යාංශය වෙත ලද මුදල් වලින් තවදුරටත් ඉතිරි රු.606,209ක මුදල එම කාර්යය සඳහා ඉදිරිපත් වූ සියලු බිල්පත්වලට ගෙවීම් කර අවසන් කර ඇති බව සහතික කර ගැනීමෙන් පසුව ඉදිරියේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත. | පොදු තැන්පත් ගිණුමේ ඉතිරි මුදල් රාජ්‍ය ආදායමට බැරකළ යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් (SA 82) ප්‍රකාශයට අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.721,915,845 ක් වුවද, 2023 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ 2023 ජනවාරි 01 දින ශේෂය රු.701,459,049ක් ලෙස දක්වා තිබීම නිසා රු.20,456,796ක වෙනසක් විය. | කාර්යාල ගොඩනැගිලි (611/201) යටතේ අමාත්‍යාංශ ගොඩනැගිල්ලෙහි අතිරේක මහල් 03 ක් ඉදිකිරීම්වලට අදාළව අගෝස්තු මස දක්වා ගෙවීම් උප අයිතම් ලෙස සිගස් වත්කම් පද්ධතියට ඇතුළත් කිරීම වෙනුවට පෙර වර්ෂයට අදාළව මහල් 03 ක් ඉදිකිරීම්වල වැඩිවීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර, පසුව මෙම වියදම් 2023 වර්ෂයේ මිලදී ගැනීමක් ලෙස සලකා වර්ෂ ආරම්භක ශේෂයෙන් ඉවත්කර සමාලෝචිත වර්ෂයේ මිලදීගැනීම් ලෙස මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළ පෙන්නුම් කර ඇත. ඉහත කරුණු ආරම්භක ශේෂය සහ වර්ෂය තුළ වත්කම් අත්කර ගැනීම් එකතු ශේෂයෙහි වෙනසට හේතු වී ඇත. | පසුගිය වර්ෂ අවසාන ශේෂයන් නිවැරදිව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ගිණුම් ගත කළ යුතුය. |
| (ii) | 2023 වර්ෂයේ වැය විෂයය අංක 151-1-2-0-2104 යටතේ රු.27,525,864 ක ගොඩනැගිලි සහ ඉදිකිරීම් මූලධන වත්කම් අත්කර ගැනීමක් සිදුකර තිබුණ ද, සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA 82) 2023 වර්ෂය තුළ මිලදී ගැනීම් රු.45,207,775 ක් ලෙස දක්වා තිබීම නිසා රු.17,681,911 ක වෙනසක් විය. | | වර්ෂය තුළ සිදුකරන ලද මූලධන වත්කම් අත්පත් කරගැනීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) 2023 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය සතු රු.994,254,549 ක්වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ලබා දී නොතිබූ අතර සියලුම ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම වත්කම් පරීක්ෂා කිරීමට හෝ මෙම වත්කම් භෞතිකව ආයතනය සතුව පවතී ද යන්න පරීක්ෂා කිරීමට හෝ නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | රජයේ වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම සඳහා විස්තරාත්මක උපලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | උක්ත ලේඛන මුදල් රෙගුලාසි ප්‍රකාරව පවත්වාගෙන යන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනය පිළියෙල කළ යුතුය. |
| (ii) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | උක්ත ලේඛන මුදල් රෙගුලාසි ප්‍රකාරව පවත්වාගෙන යන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රෙගුලාසි ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනය පැවැත්විය යුතුය. |
| (iii) **පොත් නාමාවලිය**<br>මුදල් රෙගුලාසි 454(3) ප්‍රකාරව පොත් නාමාවලියක් පවත්වා නොතිබුණි. | උක්ත ලේඛන මුදල් රෙගුලාසි ප්‍රකාරව පවත්වාගෙන යන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රෙගුලාසි ප්‍රකාරව පොත් නාමාවලිය පැවැත්විය යුතුය. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයට ලබා දී තිබූ ප්‍රතිපාදනයෙන් රු.638,016,000 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ද, රු.486,393,000 ක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය වෙත ද රු.689,535,000 ක් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත ද පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා අක් මුදල් ලබා දී තිබුණි. මේ අනුව මෙම රාජ්‍ය ආයතන 03 සඳහා අමාත්‍යාංශය විසින් එකතුව රු.1,813,944,000 ක | මෙම ප්‍රතිපාදන වලින් පුනරාවර්තන වියදම් අඩු කළ පසු ඉතිරි ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.මිලියන 213.718ට අදාළව පසුවිපරම් සහ ඇගයීම් කිරීම මෙම අමාත්‍යාංශයේ සැළසුම් අංශය සහ සංවර්ධන අංශය හරහා කාර්තුගතව සිදු කරනු ලැබේ. විශේෂිත අවස්ථාවන්වලදී අවශ්‍ය උපදෙස්ද නිකුත් කරන අතර කාර්තුගත ඇගයුම්වල තොරතුරු විගණකාධිපතිටද පිටපත් සහිතව මහා භාණ්ඩාගාරය වෙතද යොමු කරනු ලැබේ. | අමාත්‍යාංශය යටතේ නියාමනය වන මෙම රාජ්‍ය ආයතන 03 වෙත ලබාදෙන මුදල්වලට අදාළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වාර්තා වෙන වෙනම පිළියෙල කළ යුතු අතර පසුවිපරම් හා ඇගයීම් අඛණ්ඩව සිදුකළ යුතුය. |

අක්මුදල් 2023 වර්ෂය තුල දී ලබා දී තිබුණි.

එසේ වුවද එක් එක් වැය විෂයය තුළ ඇති උප ව්‍යාපෘති සඳහා ලබා දුන් අක්මුදල් ප්‍රමාණය, ඉල්ලුම් කළ අක්මුදල් ප්‍රමාණය, ඒවා වියදම් කල ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් වියදම් වාර්තා, තොරතුරු හා එම එක් එක් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පිළියෙල කල තොරතුරු හෝ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.1,813,944,000 ක වියදම්වල නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කරගැනීමට නොහැකි විය. මේ අනුව අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පිළිබඳව පසුවිපරම් කිරීම හා ඇගයීම් සිදුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වන වැය විෂයය සහ 2023 වර්ෂයේ බැඳීම් නිරවුල් කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, ඉන් උපයෝජනයට ගෙන තිබුණේ සියයට 44 ක් පමණි. මහජන චීන සමූහාණ්ඩුවේ ප්‍රදානයක් වශයෙන් ධීවර යාත්‍රා සඳහා ලබා දී තිබූ භූමිතෙල් සහනාධාරය වෙනුවෙන් එම ඉන්ධන ධීවර යාත්‍රා වෙත බෙදා හැරීම සඳහා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු ප්‍රවාහන හා බෙදුම්කරු ගාස්තු වෙනුවෙන් සලසාගෙන තිබූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් උපයෝජනයට ගෙන තිබුණේ සියයට 49 ක් පමණි. ඒ අනුව පරිපූරක ඇස්තමේන්තු මඟින් මූලික අයවැය ඇස්තමේන්තුව වැඩි කරගැනීමට කටයුතු කර තිබුණ ද එම ප්‍රතිපාදන | මිරිදිය මත්ස්‍ය පැටවුන්ගේ ජීවන චක්‍රය අනුව මත්ස්‍ය පැටවුන් බිහිකිරීමට අභිජනනයෙන් පසු මාස 03 ක් ගත වේ. එහෙත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට ප්‍රතිපාදන 2023 නොවැම්බර් මස ලබාදුන් අතර සියයට 44 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. එමෙන්ම මහජන චීන සමූහාණ්ඩුවේ ප්‍රදාන යටතේ ධීවරයින් සඳහා ලබා දී තිබූ භූමිතෙල් සහනාධාරය 2023 වර්ෂයේ සම්පූර්ණයෙන් බෙදාහැරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කළ ද, භූමිතෙල් බෙදාහැරීම සම්පූර්ණ කිරීමට නොහැකි වූ බැවින් ඉතිරි ප්‍රමාණය 2024 වර්ෂයේ බෙදා | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදිව හා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රශස්ත ලෙස උපයෝජනය කරගෙන නොතිබුණි. | අවසන් කිරීමට නියමිතව ඇත. | |
| (ආ) | අංක 151-2-4-2-1509-0-11 දරන වැය විෂයය යටතේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සඳහා වෙනත් මෙහෙයුම් වියදම් යටතේ වාර්ෂික අයවැය මඟින් රු.100,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර රු.28,000,000 ක් මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් අතිරේක ප්‍රතිපාදන වශයෙන් සලසා ගෙන තිබුණ ද 2023 දෙසැම්බර් 31 දිනවන විට මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කරගත් රු.28,000,000 ක්ද ඇතුලුව රු.31,517,000 ක මුදලක් එනම් සියයට 28 ක් උපයෝජනය කර නොතිබුණි. | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ විදුලිය හා යන්ත්‍ර උපකරණ නඩත්තුව සඳහා රු.මිලියන 6 ක්ද, සමුද්‍රිකා නාවික යාත්‍රාවේ නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 22 ක්ද වන පරිදි රු.මිලියන 28 ක ප්‍රතිපාදනයක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගනු ලැබුව ද, එම ප්‍රතිපාදන මාරුකිරීම සිදුවූයේ වර්ෂ අවසානයේ දී බැවින් එම ප්‍රතිපාදන සඳහා අක්මුදල් ලබාගැනීමේ අපහසුතාවයක් ඇති විය. එම නිසා මෙම වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරියක් ඇති විය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදිව හා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ධීවර අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන බැරකම් ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.2,005,845 ක් වුවද, SA 92 භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් බැරකම් වාර්තාව අනුව එදිනට බැරකම් ශේෂය රු.2,605,845 ක් වුයෙන් රු.600,000 ක වෙනසක් විය. | විගණන විමසුමේ සඳහන් වන්නේ 2023 වර්ෂයට අදාලව වෙනත් ආයතනයකින් වාර්තා කරන ලද බැඳීම්/බැරකම් වේ. ඒවා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරමි. | අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන බැරකම් ලේඛනයේ පවතින බැරකම් SA 92 භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් බැරකම් වාර්තාවට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ධීවර අමාත්‍යාංශය විසින් 2023 දෙසැම්බර් 28 දින සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාව අනුව සංවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ලෙස රු.185,910,000 ක්වූ බිල්පත් අතැතිව ඇති බව සඳහන් කර තිබුණද එම බිල්පත් වටිනාකම අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් යටතේ හඳුනාගෙන නොතිබුණි. | පෙන්වා දී ඇති බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට අතපසුවීමකින් මඟහැරී ඇති අතර එසේ නොවීමට වගබලා ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල්පත් බැඳීම් හා බැරකම් යටතේ වාර්තා කර තිබිය යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) | මුදල් රෙගුලාසි 104(1) | 1,808,262 | නාරෙහේන්පිට, මුහන්දිරම් ඊ.බී.දාබරේ මාවතේ අංක 18/146 B දරන ස්ථානයේ පිහිටා තිබු ධීවර අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබූ නිල නිවස සඳහා ධීවර අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ලබා දී තිබූ සියලුම රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අස්ථානගත වී තිබෙන බව 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් විගණනය වෙත වාර්තා කර තිබුණු අතර ගොඩනැගිල්ලේ සවිකර තිබූ දොර ජනෙල් අගුළු හා ගොඩනැගිල්ලේ සවිකිරීම්ද ගලවාගෙන ගොස් තිබුණි. ඒ අනුව මෙම නිල නිවස තුල තිබුණු රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සියල්ලම අස්ථානගත වී තිබීම සහ රජයේ ගොඩනැගිලිවලට හානි සිදු වී තිබීම නිසා රජයට සිදුවී තිබෙන රු.1,808,262ක පාඩුව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඊට වගකිවයුතු පාර්ශව හදුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 අනුව ප්‍රාරම්භ පරීක්ෂණ සිදු කර ඇති අතර මීට අදාළව නාරාහේන්පිට පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත. ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 880 | | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් ධීවර අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැබීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13.6 උපවගන්තිය 40,000 | මාස දොළහක කාලපරිච්ඡේදයක් තුළ දී උත්සව අත්තිකාරම් මුදල දිය යුත්තේ එක් වරක් පමණක් වුවද අමාත්‍යාංශය විසින් නිලධාරීන් 4 දෙනෙක් වෙත 2023 වර්ෂය තුළ දී දෙවතාවක් රු.10,000 බැගින් උත්සව අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. | උත්සව අත්තිකාරම් සම්පූර්ණයෙන් අයකර ගැනීමෙන් පසු නිලධාරීන් 4 දෙනෙකු වෙත එම වර්ෂය තුළදීම අතපසුවීමකින් නැවත උත්සව අත්තිකාරම් ලබා දී ඇති අතර එසේ නොවීමට වගබලා ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13.6 උපවගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | අංක 05/2008 දරන 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | ධීවර අමාත්‍යාංශය විසින් 2023 වර්ෂය වෙනුවෙන් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර නොතිබුණි. | 2024 වර්ෂය වෙනුවෙන් සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත. | අංක 05/2008 දරන 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | අංක 02/2018 දරන 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ධීවර අමාත්‍යාංශය විසින් 2023 වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2024 වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර ඇත. | අංක 02/2018 දරන 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vi) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර, එකී ගෙවීම් පිළිබඳ විස්තර, විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා යැවීමට කටයුතු කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එලෙස කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) සහ 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්තාවේ අංක 7042730 දරන බැංකු ගිණුම පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | අංක 7042730 ගිණුම වසා දැමීමට කටයුතු කරන ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024 මැයි 03 දින දැනුම් දී ඇත. | 2023 වර්ෂය තුළ ක්‍රියාත්මකව තිබුණු නිල බැංකු ගිණුමක් බැවින් 2023 මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) සහ 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්තාවේ මෙම බැංකු ගිණුම පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් වූ ක්‍රියාකාරකම් 3ක් සඳහා රු.6,360,000 ක ප්‍රතිපාදන වෙන්කර සියයට 100 ක කාර්යසාධනයක් අපේක්ෂා කළද, ඊට අදාළ භෞතික කාර්යසාධනය සියයට 75 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | මෙම තොරතුරු අදාළ ආයතන වලින් කැඳවා ඇති අතර ලද වහාම යොමු කරමි. | කාර්ය සාධනය ළඟා කරගත හැකි පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත 2023 වර්ෂයේ ධීවර අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ රු.200,000,000 ක මුදලක් ප්‍රතිපාදන ලෙස මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි. අමාත්‍යාංශය විසින් රජයේ විගණනය වෙත ලබාදුන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාවේ ප්‍රතිපාදන ලබාදීම රු.300,000,000 ක් ලෙස සඳහන් කර ප්‍රගතිය සකස් කර තිබීම හේතුවෙන් මහා භාණ්ඩාරය විසින් ලබාදුන් ප්‍රතිපාදන මුදල් වැය කර තිබු ආකාරයෙහි ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | 2023 අයවැය ප්‍රතිපාදනයට අමතරව විශේෂ කැබිනට් අනුමැතියට අනුව අතිරේක ප්‍රතිපාදනයක් ද ලැබී ඇත. | අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් රාජ්‍ය ආයතන වලට ලබා දී තිබෙන මුදල් සඳහා වෙන වෙනම ප්‍රගති වාර්තා සකස් කළ යුතුය. |
| (ඇ) | ධීවර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සංවර්ධන වැය විෂයයන් 4ක් වෙනුවෙන් ලබා දී තිබුණු රු. 196,685,000 ක ප්‍රතිපාදන වැයකළ ආකාරය දැක්වෙන | සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 7.05 ක් ඔරුවැල්ල පුවත්පත සඳහා ද, රු.මිලියන 73.27 ක් ජලජීවී වගා | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව |

| | | |
|---|---|---|
| විස්තරාත්මක ප්‍රගතිය, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගති වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | සංවර්ධන අධිකාරියේ 2002 වර්ෂයට අදාළ ඇතැති බිල්පත් ගෙවීමට සහ රු.මිලියන 2.9 මීගමුව ප්‍රදේශයේ කුඩා පරිමාණ ධීවරයින්ට තෙප්පම් 25 ලබාදීමට මුදලින් ගෙවීම් කර ඇත. ඉතිරි ප්‍රතිපාදනය හික්කඩුව ධීවර නිවාස අලුත්වැඩියාවලට අදාළ මිල විචලනයන් සඳහා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත මුදල් රෙගුලාසි 208 යටතේ ප්‍රතිපාදන ලබාදීමට යොදවා ගෙන ඇත. | ඇගයීම් වාර්තාවට ඇතුළත් කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (i) | ධීවර වරායයන් සහ නැංගුරම්පල ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වූ 2013 ජූලි 04 දිනැති අංක 1/5/1/1/අමා.සං/2013-09 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී තිබූ අනුමැතියට අනුව ගාල්ල දිස්ත්‍රික්කයට අයත් කයිකාවල මුහුදු ප්‍රදේශයේ නැංගුරම්පලක් ඉදිකිරීම වෙනුවෙන් පැකේජ 01 සහ 02 වශයෙන් ලංසු කැඳවීම් සිදුකර පැකේජ 01 රු.132,602,410 ක කොන්ත්‍රාත් වටිනාකමට සහ පැකේජ 02 රු.113,198,400 ක කොන්ත්‍රාත් වටිනාකමට වසරක් ඇතුළත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නිම කිරීම මත පැකේජ 02 සඳහාම 2014 සැප්තැම්බර් 14 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් සමාගම විසින් පැකේජ 02 සඳහාම ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 29 දින රු.49,160,162 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් පැකේජ 02 සඳහාම ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තු සඳහා ඉදිකිරීම් බලපත්‍රයක් නොතිබීම නිසා ඉදිකිරීම් | මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කළ ව්‍යාපෘතියකි. එම ව්‍යාපෘති 2013-2015 අතර කාලයේ මධ්‍ය කාලීන අයවැය රාමුව තුල නිම කළ යුතු බව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ තුල දක්වා ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉතාම කඩිනමින් ආරම්භ කර 2015 වර්ෂය අරම්භයට පෙර අවසන් කල යුතුව තිබුණි. එම අනුමැතිය ලැබේ යැයි අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. | ඉදිකිරීම් සඳහා සියළු ආකාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අත්තිකාරම් මුදල් ගෙවීම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු ආරම්භ කිරීමත් සමගම නවතා දැමීමට සිදුවී තිබුණු අතර අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන නොතිබුණි. | | |
| (ii) | මෙම නැංගුරම්පල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශක වශයෙන් කටයුතු කළ ආයතනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම උපදේශන සමාගම සමඟ විධිමත් පරිදි ගිවිසුමක් අත්සන් කර තිබුණේ ද, එම ගිවිසුම අවලංගු කර තිබුණේ ද යන්න විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය.කෙසේ වෙතත් විගණනය වෙත ඉදිරිපත් කෙරුණු කොන්ත්‍රාත් මුදල් ගෙවීම් ලේඛන අනුව මෙම උපදේශන සමාගමට පැකේජ් 2 සඳහා රු.4,377,234 ක උපදේශන ගාස්තුවක් ගෙවීම් කර තිබුණි. නැංගුරම්පල ඉදිකිරීම සඳහා මූලික පාරිසරික වාර්තාව (IEE) ලබාගැනීම වෙනුවෙන් රු.443,975 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින මෙම උපදේශන සමාගම වෙත ගෙවා තිබුණ ද, එම මූලික පාරිසරික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | උපදේශන සමාගම පත්කර ගැනීමට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 සැප්තැම්බර් 01 දින අලුත්වැඩියා කටයුතු සිදුකිරීමෙන් පසු දින සිටම කළමැටිය ධීවර වරායේ සවිකර ඇති කැමරා 39 අක්‍රීය තත්ත්වයේ පවතින බව 2023 සැප්තැම්බර් 04 දින කළමැටිය ධීවර වරායේ කළමනාකරු විසින් කළමනාරකණ තොරතුරු තාක්ෂණ නිලධාරි දැනුවත් කර තිබුණි. කොන්ත්‍රාත් ආයතනය විසින් සවි කරන ලද කැමරා සඳහා වසර 2 ක වගකීම් කාලසීමාවක් පවතින බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කර කැමරා පද්ධතිය යථා තත්ත්වයට පත්කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කොන්ත්‍රාත්කරු විසින් මෙම අක්‍රිය කැමරා යථාතත්වයට පත් කර ඇත. | වගකීම් කාලය තුල ඇතිවන දෝෂ නිවැරදි කරවා ගැනීමට අමාත්‍යාංශය කටයුතු තළ යුතුය. |

### 3.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඊකව නැංගුරුම්පළ සංවර්ධන ව්‍යාපෘතිය රු.311,482,215 ක (වැට් රහිත) මුදලකට දින 365 කින් වැඩ නිම කිරීමේ පදනම මත කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබූ අතර 2020 ඔක්තෝබර් 20 දින වැඩ ආරම්භ කර තිබුණි. 2021 වර්ෂයේ ඔක්තෝබර් 19 දින වැඩ අවසන් කිරීමට අමාත්‍යාංශය සමග ගිවිසුම් ගත වී තිබුණ ද නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වීම නිසා අවස්ථා 4 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගැනීම් සිදුකරගෙන තිබුණි. ඒ අනුව දින 365 කින් අවසන් කළයුතු ව්‍යාපෘතිය තවත් දින 384 කින් දීර්ඝ කර ගැනීමෙන් පසුව 2022 වර්ෂයේ නොවැම්බර් 08 දින වැඩ අවසන් කර අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය විසින් රු.3,398,637 ක මුදලක් ප්‍රමාද පොළී සහ රු.464,637ක් ප්‍රමාද පොළී මත එකතුකළ අගය බදු වශයෙන් එකතුව රු.3,863,274 ක් කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේදී මෙම කොන්ත්‍රාත් ආයතනය හා ඇතිකරගත් ගිවිසුමේ සඳහන් කොන්ත්‍රාත් දත්ත ප්‍රමුඛ නීති රීති ලෙස සලකන අතර ඉන් අමතර කරුණු සඳහා ශ්‍රී ලංකා කොන්ත්‍රාත් පරිපාලන ආයතනයෙහි සම්මත ලංසු ලේඛන 02 (SBD 02) අනුව ක්‍රියා කිරීම සිදුවේ. මෙම ව්‍යාපෘතියට අදාල බිල්පත් ගෙවීම සඳහා නියමිත කාලය තුළ ගිණුම් අංශය වෙත වවුචර්පත් යොමු කිරීම සිදු කළ ද 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මහා භාණ්ඩාගාරයෙන් අදාල ව්‍යාපෘතිවලට ගෙවීම සඳහා සීමිත අක්මුදල් ප්‍රමාණයක් පමණක් නිකුත් කර ඇත. ඒ හේතුවෙන් අදාල පියවීම් නිසි කලට සිදු කිරීමට නොහැකි වී ඇති අතර එවිට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සිදු වේ. කෙසේ වෙතත් මෙම තත්වයන් අවම කර ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ප්‍රමාද පොළී ගෙවීමට සිදු නොවන පරිදි ගෙවීම් සැලසුම් කළ යුතුය. |
| (ආ) | ධීවර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කල 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් සියලු ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත ගිවිසුම් කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොමැති අතර දින 309 සිට 541ක කාල පරාසයක් දක්වා දින දීර්ඝ කරගෙන තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘති තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභ ධීවරයින්ට කඩිනමින් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය රට තුළ පැවැති වසංගත තත්ත්වය යටතේ දෛනික කාර්යන්අනුමත වීම වැනි අනපේක්ෂිත කරුණු නිසා මෙවැනි ත්ත්වයන් ඇති වී තිබේ. | ධීවරයින්ට කඩිනමින් ප්‍රතිලාභ ලැබෙන පරිදි ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ධීවර අමාත්‍යාංශය විසින් ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති 04 ක ව්‍යාපෘති නිම කිරීමේ කාලය දීර්ඝ කර තිබූ අතර, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා මුදල් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් විශාල වශයෙන් ප්‍රමාද පොලී ගෙවීම් කර තිබුණි. එවැනි අතිරේක ප්‍රමාද පොලී වියදම් සඳහා ද රජයේ ප්‍රතිපාදන මුදල් යෙදවීමට සිදුව තිබීම තුළින් රජයට විශාල මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වනවිට ධීවර අමාත්‍යාංශය විසින් ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘති 04 සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු.206,295,210 ක මුදලක් ප්‍රමාද පොලී ලෙස ගෙවා තිබූ අතර රු.20,029,039 ක ප්‍රමාද පොලී මුදලක් තවදුරටත් ගෙවීමට සහතික කර තිබුණි.ඒ අනුව ගෙවා තිබූ ප්‍රමාද පොලී එකතු වටිනාකම රු.226,324,249 ක් විය. | 2022.04.26 දිනැති 03/2022 චක්‍රලේඛය අනුව ව්‍යාපෘති සඳහා ලබාදෙන ප්‍රතිපාදන සීමාවකට ලක්වූ අතර භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිකුත් කිරීම සීමා කිරීම හේතුවෙන් ව්‍යාපෘති සඳහා මුදල් ගෙවීම ප්‍රමාද වූ අතර මෙම බිල්පත් ගිණුම් අංශය වෙත යොමු කිරීම නිවැරදිව සිදුකර තිබුණි. | ප්‍රමාද පොළී ගෙවීමට සිදු නොවන පරිදි ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ගෙවීම් සැලසුම් කළ යුතුය. |
| (ඈ) වෙල්ලමංකර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා අමාත්‍යාංශය විසින් මුදල් නොගෙවීම හේතුවෙන් වූ ප්‍රමාද පොලී ගාස්තු රු.36,351,185 ක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් විනිශ්චය මණ්ඩලය වෙත අභියාචනා කර ඇති අතර ඒ වෙනුවෙන් රු. 960,000 ක මුදලක් අමාත්‍යාංශය විසින් නීති වියදම් සඳහා දරා තිබුණි. ඉන් පසු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය වෙත අභියාචනා කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 354,500 ක මුදලක් නීති වියදම් සඳහා ගෙවීම් කර තිබුණි. | වෙල්ලමංකර ධීවර වරාය ව්‍යාපෘතියේ 2021 හා 2022 වර්ෂ සඳහා මහා භාණ්ඩාගාරය මගින් අක්මුදල් ලබාදීමේදී සිදුවූ ප්‍රමාද වීම් හේතුවෙන් බිල්පත්වලට ගෙවීම් ප්‍රමාද වූ අතර එම බිල්පත් නියමිත කාලයට අනුව ගිණුම් අංශය වෙත යොමුකර තිබුණි. නමුත් අක්මුදල් නොමැතිවීම නිසා ගෙවීම් කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇත. | ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රමාද ගාස්තු ඇති නොවන පරිදි ගෙවීම් සැලසුම් කළ යුතුය. |

**3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුකළ යුතු වුවත් 2023 වර්ෂය සඳහා නිකුත් කර තිබුණු විගණන විමසුම් 4 කට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ විගණන විමසුම්වලින් තවදුරටත් පිළිතුරු දීමට විමසුම් 04ක් පවතින අතර ඒ සඳහාද පිළිතුර කඩිනමින් ලබා දීමට කටයුතු කරනු ඇත. | නියමිත දිනට විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිය යුතුය. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ කාර්යාල ගොඩනැගිල්ලේ අතිරේක මහල් 3 ක් ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 23 දිනැති අමප/16/2333/725/044 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.242,511,455 කට 2018 ජූනි 12 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව 2018 ජූනි 26 දින කොන්ත්‍රාත් සමාගම වැඩ ආරම්භ කර තිබුණු අතර එය දින 365 කින් එනම් 2019 ජූනි 25 දින වැඩ අවසන් කිරීමට තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු අපේක්ෂිත කාර්යක්ෂමතාවයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 06 දින අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. මෙම කොන්ත්‍රාත්කරු අසාදුගත කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. මෙම අතිරේක මහල් තුන ඉදිකිරීම් කාර්යය සිදුකිරීමේ දී කොන්ත්‍රාත්කරු නොසැලකිලිමත්ව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම නිසා අමාත්‍යාංශයේ මහල් තුළට වැසි ජලය කාන්දු වී රු.10,061,054ක රජයේ දේපලවලට හානි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම හානිය සිදු වී වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, සිදු වී තිබුණු රජයේ දේපළ හානිය අයකර ගැනීමට හා මෙවැනි හානි වලක්වා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අවධානය යොමු කර නොතිබුණි. | 2019.09.10 දින පැවති රැස්වීමේදී තීරණය කළ පරිදි හානිය ගණනය කිරීම හා අලාභය අය කර ගැනීම සඳහා කමිටුවක් පත් කර තිබුණද අදාල තොරතුරු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ පාර්ශව වලින් නියමිත පරිදි නොලැබීම හේතුවෙන් එය සිදු වී නොමැත. පසුව ඒ සම්බන්ධයෙන් 2023.06.26 දින නව කමිටුවක් පත් කරන ලද අතර එහි වාර්තාව 2023.11.05 දින ඉදිරිපත් කර ඇත. 2024.02.26 දින මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කිරීමට කමිටුවක් පත් කර ඇත. එම කටයුතු සිදු කරමින් පවතී. | රජයේ දේපළ වලට සිදු වී තිබෙන හානිය කඩිනමින් වගකිවයුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය. |
| (ආ) | ධීවර අමාත්‍යාංශයේ භාෂා පරිවර්තක තනතුර දැරූ නිලධාරිනිය විසින් 2022 සැප්තැම්බර් 07 දින සිට රාජකාරිය සඳහා වාර්තා කර නොමැති අතර 2023 මාර්තු 27 දින ධීවර අමාත්‍යාංශය විසින් තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර තිබුණි. තව ද සංවර්ධන නිලධාරිනියක් විසින් ද 2023 දෙසැම්බර් 06 දින සිට රාජකාරිය සඳහා වාර්තා කර නොමැති අතර 2024 පෙබරවාරි 02 දින තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් භාෂා පරිවර්තක නිලධාරිනිය හට වැඩිපුර ගෙවා තිබූ වැටුප් හා දීමනා, ලිත් මසක වැටුපත්, මාස 112 ක අනිවාර්ය සේවා කාලයකට යටත්ව ගිවිසුමට බැඳී තිබූ බැවින් ඒ සඳහා ගෙවිය යුතු දණ්ඩන | ගිවිසුම්ගත මුදල අයකරගැනීම සඳහා නීතිපති පවසා ඇති අතර වැටුප් අයකර ගැනීමට අදාළ ලිපිය ප්‍රදේශීය ලේකම් වෙත යොමුකර ඇත. | ගිවිසුම් ගත මුදල් සහ වැඩිපුර ගෙන ඇති වැටුප් කඩිනමින් රජයට අය කර ගත යුතුය. |

මුදලක් ලෙස රු.563,818 ක් හා සංවර්ධන නිලධාරිනිය හට වැඩිපුර ගෙවා ඇති වැටුප් හා දීමනා සහ ලිත් මසක වැටුප් හා දීමනා වශයෙන් රු.71,297 ක මුදලක් වශයෙන් එකතු වටිනාකම රු.635,115 ක මුදලක් රජය වෙත අයකර ගත යුතුව පැවතුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු 09 කට අදාළ පුරප්පාඩු 09 ක් සහ ද්විතීක මට්ටමේ තනතුරු 02 කට අදාළ පුරප්පාඩු 32 ක් පැවතීම ධීවර අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟාවීමට බාධාවක් විය හැකිව තිබුණි. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර මේ වන විටත් පුරප්පාඩු වූ තනතුරු කිහිපයකට නිලධාරීන් පත්කර ඇත. | අමාත්‍යාංශයේ අරමුණු කරා ලඟා වීමට බාධාවක් විය හැකි පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කර තිබූ අනුමත කාර්ය මණ්ඩල සහ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තරය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබානොගත් කළමනාකරණ සහකාර, රියදුරු හා කාර්යාල කාර්ය සහායක තනතුරුවල නිලධාරීන් 4 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දිනවන විට සේවයේ යෙදී ඇත. | මෙම තනතුරු හතර සඳහා 2019.09.18 දිනැති අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පත්වීම් ලබා දී ඇති අතර අදාළ අනුමැතියක් ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. කෙසේ වෙතත් මේ වන විට දෙදෙනෙක් සේවයෙන් ඉවත්ව ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සම්බන්ධව යම් සංශෝධනයන් සිදුකරන අවස්ථාවලදී ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 18 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ 2023 වර්ෂයේ ධීවර අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාවේ සේවක සංඛ්‍යා කළමනාකරණ ඡේදය යටතේ ද්විතීක සේවා ගණයේ නිලධාරීන් 32 ක ඌණතාවයන් පවතින බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, අමාත්‍යාංශයට අනුයුක්ත ද්විතීක සේවා ගණයට අයත් උපාධිධාරී සංවර්ධන නිලධාරීන් 48 දෙනෙකු අමාත්‍යාංශය යටතේ තිබෙන වෙනත් | පිළිතුරු ඉදිරිපත් කර නැත. | පුරප්පාඩුව පවතින කාර්යමණ්ඩලය වෙනත් ආයතනවල අතිරික්ත කාර්යමණ්ඩලය මඟින් ආවරණය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනය වෙත අනුයුක්ත කර තිබිය දී කාර්යසාධන වාර්තාවේ සේවක ඌණතාවයන් දක්වා තිබීම විගණනයේ දී ගැටලු සහගත විය. | | |
| (ඇ) | අයවැය සහකාර, සැපයුම් සහකාර හා සැලසුම් සහකාර යන ද්විතියික මට්ටමේ තනතුරු 3 හි පුරප්පාඩු 5 ක් පවතින බව අනුමත සේවක සංඛ්‍යා පිළිබඳ විස්තරයෙහි දක්වා තිබුණද, එම තනතුරුවල සිටින නිලධාරීන් විධිමත් පරිදි වෙනත් සේවයකට අන්තර්ග්‍රහණය වීමෙන් පසු එම තනතුර පුරප්පාඩු වූ විට එම තනතුර අහෝසි වන බව විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරුවලින් සනාථ වූ නමුත් 2023 දෙසැම්බර් 31 දින එම තනතුරු අහෝසි නොකර පුරප්පාඩු තනතුරු ලෙස දක්වා තිබුණි. | එම තනතුරු අහෝසි කිරිමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදුකර කාර්යමණ්ඩලය අනුමත කරවා ගත යුතුය. |